# ශ්‍රී ලංකා- එක්සත් ජනපද සහයෝගිතා සංවාදය පිළිබඳව ශ්‍රී ලංකා විදේශ කටයුතු අමාත්‍යාංශය සහ එක්සත් ජනපද රාජ්‍ය දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ඒකාබද්ධ නිවේදනය

## 2017 නොවැම්බර් 06

ප්‍රජාතන්ත්‍රවාදය, නීතියේ ආධිපත්‍යය, සහ අපගේ ජනතාවන්ගේ සමෘද්ධිය සහ යහපත පිණිස වූ ඇපකැපවීම බෙදාහදා ගනිමින්, ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය 2017 නොවැම්බර් මස 6 වැනි දින කොළඹදී සිය දෙවැනි සහයෝගීතා සංවාදය පැවැත්වීය. ශ්‍රී ලංකා විදේශ ලේකම් ප්‍රසාද් කාරියවසම් සහ දේශපාලන කටයුතු පිළිබඳ එක්සත් ජනපද නියෝජ්‍ය රාජ්‍ය ලේකම් තෝමස් ෂැනන් යන මහත්වරු දෙරටේ නියෝජිත පිරිස්වලට නායකත්වය සැපයුහ. එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව අතර සහයෝගිතාව තහවුරුවීම ප්‍රදර්ශනය කරන මෙම සහයෝගිතා සංවාදය, විධිමත් සහ ව්‍යුහගත හමුවීම් ඔස්සේ ද්විපාර්ශ්වීය සබඳතා පුළුල් ලෙස තවදුරටත් ශක්තිමත් කර ඉහළ නැංවීමට කටයුතු කරයි.

ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍ය දෙකක් ලෙස, නිදහස් සහ විවෘත ඉන්දු-ශාන්තිකර කලාපයක් උදෙසාද ලොව වටා වැඩිතර සාමයක් සහ ස්ථාවරබව වෙනුවෙන්ද එක්ව කටයුතු කිරීමට රජයන් දෙක මෙහිදී අදිටන් කර ගත්තේය. ගෝලීය පොදු වස්තූන් පරිහරණය කරන සියලුම රටවල් ජාත්‍යන්තර නීති සහ සම්මුතීන්වලට ගරු කරන බව සහතික කරන, නීති මත පදනම් වූ ක්‍රමයක් ප්‍රවර්ධනය කිරීම මගින් ඉන්දියානු සාගර කලාපයේ ආරක්ෂාව, ස්ථාවරත්වය සහ සමෘද්ධිය ආරක්ෂා කරගත යුතු බවට එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව එකඟත්වය පළ කළේය. සාමය සහ ස්ථාවරත්වය සඳහා වූ මෙම දැක්ම කලාපීය වශයෙනුත්, ජාත්‍යන්තර සංසදවලදීත් ඉදිරියට ගෙනයෑමට එකඟ වූ දෙරට, යාත්‍රා කිරීමේ සහ පියාසර කිරීමේ නිදහසේත්, නිර්බාධ වෙළෙඳාමද ඇතුළත්, නීතියේ ආධිපත්‍යය මත පදනම් වූ සාමුද්‍රික ක්‍රමයක් පවත්වාගෙන යෑමේත් සුවිශේෂී වැදගත්කම අවධාරණය කළ අතර, මුහුදු කොල්ලකෑම්වලට එරෙහි පියවරද ඇතුළත්ව, සාමුද්‍රික ආරක්ෂාව සම්බන්ධ සහයෝගීතාව සහ හුවමාරු තවදුරටත් ප්‍රවර්ධනය කිරීමේ අධ්‍යාශය පළ කළේය. සිය මුහුදු සීමාවන් ඵලදායී ලෙස මුර කරනු හැකි වනු පිණිසත් සිය සාමුද්‍රික සම්පත් ආරක්ෂා කරගනු පිණිසත් තම සාමුද්‍රික ශක්නුතාවන් වර්ධනය ගැනීමට දූපත් රාජ්‍යයක් ලෙස තමන්ට ඇති අවශ්‍යතාව ශ්‍රී ලංකාව අවධාරණය කළේය.

කලාපයේ ආර්ථික වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වන, නිදහස් සහ විවෘත සාගර ඔස්සේ ආසියාන් කලාපය, ඉන්දියාව, මැදපෙරදිග සහ අප්‍රිකාව අතර වෙළෙඳ ප්‍රවාහයන් සම්බන්ධ කරන, ආසියාවේ වෙළෙඳ සහ ආයෝජන සඳහා වූ කලාපීය මධ්‍යස්ථානය වශයෙන් ශ්‍රී ලංකාව සංවර්ධනය කිරීමේ දැක්ම ගැනද මෙහිදී සාකච්ඡාවට බඳුන් විය. වෙළෙඳාම, ආයෝජන, විදේශ ආධාර සහ රට පුරා විසිරි කොටස්කරුවන් සමග සෘජුවම ගොඩනගන සහයෝගිතාවන් මගින් ශ්‍රී ලංකාවට සහය දෙන බව එක්සත් ජනපදය ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාව සමඟ පවත්වන ශක්තිමත් ආර්ථික සහයෝගිතාවක් සහ ප්‍රබල වෙළෙඳ සබඳතාවක් උදෙසා එක්සත් ජනපදය ඇපකැප වී සිටියි.

2016 පෙබරවාරි මාසයේදී පැවත්වූ පළමු සහයෝගීතා සංවාදයේ සිට ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය සිය ද්විපාර්ශ්වික සබඳතාවල සැලකිය යුතු තරමේ ප්‍රගතියක් ලබා ඇත. නීතිය ක්‍රියාත්මක කිරීම, මත්ද්‍රව්‍ය විරෝධී පියවර, ත්‍රස්ත විරෝධී පියවර මෙන්ම මුල්‍යමය සහ ණය පිළිබඳ අභියෝගයන්ට මුහුණදීම සඳහාත්, නීතියේ ආධිපත්‍යය ශක්තිමත් කිරීම සඳහාත්, විනිවිදභාවය ඉහළ නැංවීම සඳහාත් ඇති කරනු ලැබූ එක්සත් ජනපද භාණ්ඩාගාර සහ අධිකරණ දෙපාර්තමේන්තු වැඩසටහන් ආදී ක්ෂේත්‍රවල සහයෝගිතාව මීට අයත් වෙයි. ඉහළ පෙළේ එක්සත් ජනපද නියෝජිත පිරිස් ශ්‍රී ලංකාවේ කළ සංචාර සහ අතිගරු ජනාධිපතිතුමා, ගරු කතානායකතුමා සහ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යතුමා ආදීන් එක්සත් ජනපදයේ කළ සංචාරද ඇතුළත්ව ඉතා වැදගත් නිල සංචාර රැසක්ම දෙරට අතර සිදු කෙරිණි.

දෙරට අතර පවතින ශක්තිමත් ද්විපාර්ශ්වීය සබඳතාවල සහ දිනෙන් දින පෘථුල වන ශ්‍රී ලංකාවේ එක්සත් ජනපද ක්‍රියාකාරකම්වල සලකුණක් වශයෙන්, කොංග්‍රස් මණ්ඩලය මගින් නිවේදනය කිරීමේ ක්‍රියා පරිපාටිය සම්පූර්ණ කිරීමට යටත්ව, ශ්‍රී ලංකා නාවික හමුදාවට දෙවැනි එක්සත් ජනපද වෙරළාරක්ෂක යාත්‍රාව පිරිනමන බව එක්සත් ජනපදය නිවේදනය කළේය. ලේකම් පන්තියට අයත් ඉහළ දරාගැනීමේ ශක්තියකින් යුත් මෙම යාත්‍රාව හේතුවෙන් ශ්‍රී ලංකාවට වඩාත් ඵලදායී ලෙස සිය වෙරළ තීරය සහ විශේෂිත ආර්ථික කලාපය මුරකිරීමටත්, සිය වෙළෙඳ හා සන්නිවේදන මුහුදු මාර්ග ආරක්ෂා කරගැනීමටත් හැකි වනු ඇත. එක්සත් ජනපද සාම බළසේනා ස්වේච්ඡා සේවකයන් ශ්‍රී ලංකාවේ ඉංග්‍රීසි භාෂා පන්තිකාමර වෙත යළි එවීම සඳහා එක්සත් ජනපදය ශ්‍රී ලංකා රජය සමඟ කටයුතු කරමින් සිටියි. ඵලදායිතාව, කිරිවල ගුණාත්මකබව, මුදල් යෙදවීම, ආහාර ආරක්ෂාව සහ වෙළෙඳාම ඉහළ නැංවීම මගින් ශ්‍රී ලංකාවේ කිරි නිෂ්පාදන ක්ෂේත්‍රය නව්‍යකරණය සහ ශක්තිමත් කිරීම සඳහා එක්සත් ජනපද කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ 'ප්‍රගතිය සඳහා ආහාර' වැඩසටහනෙන් පිරිනමන ලද ඩොලර් මිලියන 21/ ශ්‍රී ලංකා රුපියල් 3,150,000,000 ක වටිනාකමින් යුත් ව්‍යාපෘතියක්ද එක්සත් ජනපදය විසින් ප්‍රකාශයට පත් කරන ලදී. ශ්‍රී ලංකාවට ආධාර සැපයීම සඳහා සහස්‍රක අභියෝගතා සමායතන (මිලේනියම් චැලේන්ජ් කෝපරේෂන්) ගිවිසුමක් 2017-2018 කාලය තුළ නිර්මාණය කෙරෙනු ඇත.

ශ්‍රී ලංකාවේ මැරීන් බළකාය පිහිටුවීම සඳහා එක්සත් ජනපද මැරීන් බළකාය විසින් රඟදක්වනු ලැබූ භූමිකාවද, එක්සත් ජනපදයේ පිහිටි වෘත්තිමය හමුදා විද්‍යාතනවලට ශ්‍රී ලාංකික අයැදුම්කරුවන් යැවීමද, ද්විපාර්ශ්වික යුද අභ්‍යාස සහ නෞකාවල ආගමනයන්ද, දෙරටේම ජ්‍යෙෂ්ඨ හමුදා නිලධාරීන් අතර වූ හමුවීම්ද ඇතුළුව, ඉහළ නංවනු ලැබූ හමුදා සහයෝගිතාවෙහි ද්විපාර්ශ්වික සහ කලාපීය ක්‍රමෝපායික වාසි දෙරට විසින්ම පිළිගන්නා ලදී.

කල්පවතින සාමය සහ සමෘද්ධිය ළඟා කරගැනීම පිණිස සංහිඳියාව, වගවීම සහ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමට ශ්‍රී ලංකාවේ ඇති කැපවීම ගැන යළි ප්‍රතිඥාවක් දෙමින්, 2017 මාර්තු මාසයේදී එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිලයේදී සම්මත කරගත් යෝජනාවකට තමන් සම-අනුග්‍රාහකත්වය සැපයූ අයුරු ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය

ආවර්ජනය කළේය. අතුරුදන්වූවන්ගේ පවුල්වලට අතුරුදන්වූවන් ගැන තථ්‍ය තොරතුරු සැපයීම සහ ආරක්ෂක ආයතනවල වෘත්තීමයභාවය ඉහළ නැංවීම සඳහා යෝග්‍ය ප්‍රතිසංස්කරණ ක්‍රියාත්මක කිරීම ආදිය ඇතුළත් සත්‍ය සෙවීම, යුක්තිය, හානිපූර්ණය සහ ගැටුම් යළි ඇති නොවීම පිණිස වන සහතිකවීම් වැනි, එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කවුන්සිල යෝජනා සම්මතයෙන් එකඟ වූ කරුණු ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවට සහයෝගය ලබා දෙන බව එක්සත් ජනපදය ප්‍රකාශ කළේය. ශ්‍රී ලංකාවේ ජනතාවගේ අභිලාෂය පිළිබිඹු කරන මෙම ප්‍රතිඥාවන් ක්‍රියාත්මක කිරීම සඳහා, සංහිඳියා ක්‍රියාකාරකම්වලට ලබා දෙන සහය ඔස්සේ, ජාත්‍යන්තර සංවර්ධනය පිළිබඳ එක්සත් ජනපද ඒජන්සිය (USAID) ශ්‍රී ලංකා රජයට සහය වෙයි.

ප්‍රජාතන්ත්‍රවාදය, ප්‍රජාතන්ත්‍රවාදී ආයතන සහ ව්‍යවහාරයන්, යහපාලනය, නීතියේ ආධිපත්‍යය, යුක්තිය, සංහිඳියාව, වගවීම සහ පාර්ලිමේන්තු ක්‍රියාදාමයන් ශක්තිමත් කිරීම සඳහා ශ්‍රී ලංකා රජය තුළ ඇති කැපවීම මෙහිදී අවධාරණය කැරිණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණවල ප්‍රගතිය, ආරක්ෂක හමුදා විසින් අත්කරගෙන සිටි පෞද්ගලික ඉඩම් යළි ඒවායේ අයිතිකරුවන් වෙත ලබාදීම සහ අතුරුදන්වූවන් වෙනුවෙන් ස්වාධීන සහ නිත්‍ය කාර්යාලයක් පිහිටුවීම එක්සත් ජනපදයේ ප්‍රසාදයට ලක්විය.

දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කෙරෙන සංහිඳියා, නීතියේ ආධිපත්‍යය සහ අධිකරණ ප්‍රතිසංස්කරණ ප්‍රයත්නයන්ට සමාන්තරව ද්විපාර්ශ්වීය ආරක්ෂක අංශ අතර සහයෝගිතාව දිගටම ක්‍රියාත්මක වෙයි. බිම් බෝම්බ ඉවත් කිරීම, ඒකාබද්ධ හමුදා ක්‍රියාකාරකම්, ශ්‍රී ලාංකික හමුදා නිලධාරීන්ට ලබා දෙන මානව හිමිකම් පුහුණුව, සහ නෞකාවල සහ හමුදා නිලධාරීන්ගේ ආගමනයන්ද මීට ඇතුළත්ය.

අයිසිස් සංවිධානය වැනි ත්‍රස්තවාදී සංවිධානවලින් ගෝලීය ආරක්ෂාවට එල්ල වී ඇති දැඩි තර්ජන සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව සහ එක්සත් ජනපදය සිය කනස්සල්ල පළ කළේය.

උතුරු කොරියාවේ නීතිවිරෝධී න්‍යෂ්ටික සහ බැලිස්ටික මිසයිල වැඩසටහන්වලින් ජාත්‍යන්තර සාමයට සහ ආරක්ෂාවට එල්ල වී ඇති තර්ජනයද මෙහිදී සාකච්ඡාවට බඳුන් වූ අතර, කොරියානු ප්‍රජාතන්ත්‍රවාදී ජනතා ජනරජයට එක්සත් ජාතීන්ගේ සියලු සාමාජික රටවල් දිගටම පීඩනය එල්ල කිරීමේ සහ මේ සම්බන්ධයෙන් එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලය විසින් සම්මත කරගනු ලැබූ යෝජනාවන් පූර්ණ වශයෙන් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කමද අවධාරණය කෙරිණි.

2017 අගෝස්තු-සැප්තැම්බර් යන මාසවලදී ශ්‍රී ලංකාව විසින් සත්කාරකත්වය දරන ලද ඉන්දියානු සාගර කලාපීය සම්මන්ත්‍රණය දෙරට විසින්ම සතුටින් සිහි කරන ලදී. එමෙන්ම ඉන්දු-ශාන්තිකර කලාපයේ ආරක්ෂාව, ස්ථාවරත්වය, විනිවිදභාවය සහ ආර්ථික අවස්ථා ඉහළ නංවන ඒකාබද්ධ පියවර දිගින් දිගටම ගැනීමට දෙරටම එකඟ විය.

සිය ද්විපාර්ශ්වීය සබඳතාවෙහි වැදගත්කම ගැන එක්ව අවධාරණය කළ එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව, අන්‍යෝන්‍ය යහපත වෙනුවෙන් එක්සත් ජනපද-ශ්‍රී ලංකා සහයෝගිතාව ව්‍යාප්ත කිරීමටත්, ශක්තිමත් කිරීමටත් තමන් තුළ ඇති කැපවීම ප්‍රකාශයට පත් කළේය.

එක්සත් ජනපදය යනු 1948 දී නිදහස ලැබීමෙන් පසු ශ්‍රී ලංකාව පිළිගැනීමට ලක්කළ පළමු රාජ්‍යයන් අතරින් එකක් විය. 2018 වසරේදී එක්සත් ජනපදය සහ ශ්‍රී ලංකාව දෙරට අතර රාජ්‍ය තාන්ත්‍රික සබඳතා පිහිටුවීමේ 70 වැනි සංවත්සරය සමරද්දී, සිය සබඳතා සහ අන්‍යෝන්‍ය සහයෝගය ඉහළ නැංවීම සඳහා කටයුතු කරන්නට තමන් තුළ ඇති කැපවීම පිළිබඳව මෙහිදී දෙරට යළි ප්‍රතිඥා දුන්නේය.